## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2018
---------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා

මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු කරුණු සටහන් අංක 2.3.3 යටතේ දක්වා ඇති පරිදි පරිගණක හා උපකරණ සියයට 25 කින් ක්ෂය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සියයට 20ක් ක්ෂය කර තිබීම නිසා පරිගණක හා උපකරණ ක්ෂය රු.126,485ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ක්ෂය ගණනය කිරීමේ දී සිදු වූ දෝෂයකි. 2019 ගිණුම් පිළියෙළ කිරීමේ දී නිවැරදි කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ආ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු කරුණු සටහන් අංක 2.3.3 යටතේ දක්වා ඇති වසර 10 ට වඩා වැඩි කාලයක් භාවිතා කල මෝටර් වාහන සඳහා සියයට 20 කින් ක්ෂය වෙන් කිරීම් සිදු කල යුතු වුවත් 2013 ජනවාරි 01 දිනට රු.24,200,000 කට ප්‍රත්‍යාගණනය කළ වර්ෂ 10 ක් භාවිතා කළ මෝටර් රථ සඳහා ද සියයට 10 කින් ක්ෂය කර තිබීම නිසා ක්ෂය වීම් රු.2,420,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ක්ෂය ගණනය කිරීමේ දී සිදු වූ දෝෂයකි. 2019 ගිණුම් පිළියෙළ කිරීමේ දී නිවැරදි කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබූ ව්‍යාපෘතියකින් මණ්ඩලයට අයවිය යුතු රු.2,323,225 ක් ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකර අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයේ දී මුදල් දෙනු ලැබුවේ අත්තිකාරමක් ලෙස බැවින් අත්තිකාරමක් ලෙස ගිණුම් ගත කරන ලදී. අදාල ආයතනය විසින් වාරික වශයෙන් ආපසු ගෙවීම් සිදු කරයි. අවසන් වාරිකය ලැබුණේ 2018 දෙසැම්බර් 31 දින දීය. වාරික අයකර ගැනීම නීති අංශය විසින් සිදු කරනු ලබයි. 2019 වර්ෂයේ දී ලැබිය යුතු ඉතිරි මුදල ණයගැති ගිණුමට මාරු කරනු ඇත. | මණ්ඩලයට අයවිය යුතු මුදල් අත්තිකාරම් ලෙස නොදක්වා ණයගැතියන් ලෙස පෙන්විය යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂවලට අදාල ව සිදුකර තිබූ එකතුව රු.158,853 ක් වූ නිල ලාංඡන මුද්‍රණය සහ ටෝනර් මිල දී ගැනීමට වූ වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්කරණ දෝෂයකි. ඉන් මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් සිදු වී නොමැත. | වියදම් අදාල වර්ෂයේ වියදම් ලෙස ගත යුතුය. |
| (ඇ) 2012 වර්ෂයේ දී රු.12,900,000 කට ප්‍රත්‍යාගණනය කර මේ වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ මෝටර් වාහන සමාලෝචිත වර්ෂයේදී රු.2,010,000 කින් ක්ෂය කර තිබුණි. | 2019 ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කරනු ඇත. | ක්ෂය ගණනය කිරීමේ දී සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වත්කම් සඳහා ක්ෂය නොකල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු කළ අගය මත බදු ගිණුමේ 2013 වර්ෂයේ සිට පැවැති ලැබිය යුතු ශේෂය වූ රු.104,676,878 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | මෙම මුදලින් රු.28,659,649 ක මුදලක් බදු වැඩිපුර ගෙවීමක් ලෙසට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2004-2006 කාලය තුල තක්සේරු වාර්තාවල සඳහන් කර ඇත .ආයතනය විසින් දිගින් දිගටම මෙම මුදල ලබා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්මේන්තුවට ලිපි මගින් සහ ඊමේල් මගින් දැනුම් දී ඇති නමුත් ඔවුන්ගෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | නිරවුල් කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ආ) | 2009 වර්ෂයේ සිට පැවැත එන ඌව පළාත් කෘෂි අපනයන කලාපයෙන් ලැබිය යුතු රු.10,403,683 ක් අයකර කරගෙන නොතිබුණි. | මෙම මුදල පියවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | පියවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වෙනත් ණයගැතියන් දොළහක එකතුව රු.4,441,903 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන DHPL ගොඩනැගිල්ල සඳහා වූ වාර්ෂික කුලිය රු.60,750,000 ක් වුවද වාර්ෂික අයවැය පිළියෙළ කිරීමේ දී රු.12,750,000 ක් අඩුවෙන් සඳහන් කිරීමත් ඉකුත් වර්ෂයේදීද භාණ්ඩාගාරයෙන් අඩුවෙන් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම නිසාත් සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු.30,375,000 ක් විය. | 2018 වසර දක්වා වාර්ෂික අයවැය පිළියෙල කර ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන පමණක් පදනම් කරගෙනය. භාණ්ඩාගාර අරමුදලින් ගොඩනැගිලි කුලිය සඳහා වෙන් කරන ලද මුදල රු.මිලියන 46.25 කි. ඉතිරි මුදල ලාභාංශ සහ අනෙකුත් ආදායම් මගින් පියවා ගත යුතුය.<br>2018 වසර අග හිඟ ගොඩනැගිලි කුලියට හේතු වූයේ 2017 වසරේ ප්‍රතිපාදිත භාණ්ඩාගාර අරමුදල් අඩුවෙන් ලැබීමය. හිඟ මුදල් මහා භාණ්ඩාගාරය විසින් 2019 මැයි 14 දිනැති ලිපියෙන් අනුමත කර ඇති බව අප වෙත දන්වා ඇත. | අයවැය පිළියෙළ කිරීමේ දී නිශ්චිත ගොඩනැඟිලි කුලිය ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු අතර ගොඩනැඟිලි කුලී සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන අඩු නම් එම වෙන්කරනු ලබන ප්‍රතිපාදනවලට ප්‍රමාණවත් වන පරිදි ගොඩනැඟිලි කුලියට ගැනීම සඳහා යොමු විය යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 396 | 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් සඳහා නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ අගරු වූ රු.586,047 ක චෙක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආරම්භයේ සිට ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් වසර තුනක කාලයක් ඉදිරිපත් නොකළ චෙක්පත් ගිණුමෙහි (unpresented cheques account) රඳවා තබා හිමිකම් නොපාන ලද චෙක්පත් විවිධ ආදායම් ගිණුමට මාරු කරනු ලබයි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6. ඡේදය | කාර්තුවක් අවසන් වී දින 30ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා කාර්තුවක් අවසන් වී දින 30 ක් තුල රේඛිය අමාත්‍යාංශය වෙත යැවීමට කළමනාකරණය කටයුතු කර ඇත. කෙසේ වුවත් ඉදිරියට එවැනි ප්‍රමාදවීම් සිදු නොවනු ඇත. | කාර්තුමය කාර්ය සාධන වාර්තා රජයේ විගණන අංශය වෙත ද ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.99,415,402 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,282,474 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.79,132,928 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආශ්‍රිත සමාගමේ කර තිබූ ආයෝජනයෙන් ලද රු.91,185,567 ක අලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ගවලින් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 41 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ සියයට 50 ක් වැඩියෙන් ලැබීම හේතු වී තිබුණි.

(ආ) විවිධ ආදායම් මාර්ගවලින් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 52 කින් පිරිහී තිබුණි.

(ඇ) වෙනත් ආදායම් මාර්ගවලින් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 27 කින් පිරිහී තිබූ අතර ලාභාංශ ආදායම් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ සියයට 33 කින් අඩුවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

(ඈ) මණ්ඩලයේ ආශ්‍රිත සමාගමක් වන DHPL හි ආයෝජනයෙන් ලද ලාභ කොටස ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 220 කින් පිරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය සමාගම් 35 ක සමාන්‍ය කොටස්වල හා සමාගම් 29 ක වරණිය කොටස්වල ආයෝජනය කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දිනට එම ශේෂයන් පිළිවෙළින් රු. 58,312,483 ක් හා රු. 105,066,208 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී ඉන් සමාගම් තුනක පමණක් සාමාන්‍ය කොටස් මත සිදුකර තිබූ රු.14,418,550 ක ආයෝජනය මත රු.3,952,557 ක ලාභාංශ ලැබී තිබූ අතර ඉතිරි සාමාන්‍ය කොටස්වල ආයෝජන කළ සමාගම්වලින් සහ වරණීය කොටස් මත සිදු කර තිබූ සමාගම් 29 ක ආයෝජනයෙන් කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. තව ද මෙම ආයෝජන වලින් එකතුව රු. 17,315,000 ක් ආයෝජනය කර තිබූ සමාගම් 3 ක් 2002, 2007 සහ 2009 යන වර්ෂ වලදී විසුරුවා හැර තිබූ අතර ඇවරකරු විසින් කොටස් වල ආයෝජිත මුදල් ආපසු ගෙවීමට වත්කම් නොමැති බව දක්වා තිබුණි. තවද සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් කපා හැර තිබූ සමාගම් 25 ක ආයෝජනය කර තිබූ රු. 58,587,917 ක් ද අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර මණ්ඩලය විසින් ආයෝජන කාලානුරූපව සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභ වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසර ලබා ගෙන සමාගම් ලැයිස්තුවෙන් කපා හරින ලද සමාගම් 11 ක ලිපිගොනු පරීක්ෂා කරන ලදී. සමාගම් 02ක වත්කම් ඇති බැවින් එම වත්කම් රාජසන්තක කිරීමට පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලදී. සමාගම් 02 ක් නැවත ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. ඉතිරි සමාගම්වල ලිපිගොනු පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කිරීමට කටයුතු කරමින් පවතී. | මණ්ඩලයට අයවීමට ඇති මුදල් අයකර ගැනීමට අවශ්‍ය වඩාත් සුදුසුම ක්‍රියාමාර්ග ගත යුතු අතර වර්තමානයේ ලාභ නොලබන ආයතන පිළිබඳව පරීක්ෂා කර බැලිය යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 මැයි 14 දින සිට මැයි 17 දින දක්වා නෙදර්ලන්තයේ පැවැත්වූ අපනයන ප්‍රවර්ධන වැඩ සටහන යටතේ අපනයනකරුවන් 25 දෙනෙකු සහභාගි කරවීමට රු.මිලියන 6.8 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් රු.මිලියන 4.5 ක් වැය කර සහභාගී කර තිබුණේ 19 දෙනෙකු පමණක් වූ අතර සහභාගී වූ අයගෙන් 08 දෙනෙකු අපනයන වෙළඳපළේ කොටස් හිමි කර ගැනීමට නොහැකි වූ බවත් ඊට සහභාගී වීමෙන් තම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වූ බවත් ඔවුන් ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාවලින් පෙන්නුම් කර තිබුණි. තවද ප්‍රදර්ශනයට සහභාගී වූවන් විසින් සපුරාලිය යුතු හා අත් කරගත යුතු ප්‍රගතිය පිළිබඳ මණ්ඩලය අතර ගිවිසුමකට එළඹී නොතිබුණි. | අදාල රටවල්වල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල උපදෙස් සහ නිශ්චිත වෙළඳපොළ සඳහා යෝග්‍යතාවය සැලකිල්ලට ගතයුතු නිසා සමාගම් 19 ක් පමණක් තෝරා ගැනීමට සිදු විය. එම නිසා රු.175,000 ක මුදලක් ඉතිරි කර ගැනීමට ආයතනයට හැකි විය.<br><br>සහභාගි වූ සමාගම් 19 අතරින් තොරතුරු තාක්ෂණ සහ සංචාරක වැනි සේවාවන් අපනයනය කරන සමාගම් 7 හි අපනයන පිරිවැටුම රේගු දත්ත තුළ වාර්තා නොකෙරේ. දැනට අපනයනය නොකරන සමාගම්වලට ද එම සමාගම් වල යෝග්‍යතාවය සැලකිල්ලට ගෙන අවස්ථාව ලබාදීම අපනයන සංවර්ධන මණ්ඩලයෙහි වගකීමකි.<br><br>ප්‍රවර්ධන වැඩසටහන්වලින් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සමාගමේ සහභාගී වූ නියෝජිතයාගේ සන්නිවේදන කුසලතාවයත්, පළපුරුද්දත්, දැනුමත් මත රඳා පවතී. සහභාගී වූ සියලුම සමාගම් සඳහා ධනාත්මක ප්‍රතිඵල ලබා ගැනීමට අපහසුය. කෙසේ වෙතත්, මෙම වැඩසටහන මඟින් රටවල් තුනකින් ශ්‍රී ලංකාවට නැවත ලැබුණු EU GSP + බදු සහනය ප්‍රවර්ධනය කිරීමට හැකි විය. | ගුවන් ගමන් වියදමින් සියයට 50 ක් වූ රු.75,000 මණ්ඩලය ප්‍රතිපූර්ණය කර ඇත. එනිසා ලඟා කරගත යුතු ප්‍රගතීන් සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර ගිවිසුමක් අත්සන් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙය අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයක් නොවන නිසා ආයතනය මගින් ප්‍රතිපූර්ණය කරනු ලැබුවේ සමාගම් නියෝජිතයාගේ ගුවන් ගමන් වියදමින් සියයට 50 ක් (Rs.75,000) පමණක් බැවින් ගිවිසුම අත්සන් නොකරන ලදී. කෙසේ වෙතත් ඉදිරි වැඩ සටහන් සඳහා සඳහා නිවැරදි ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලැබේ. | |
| (ආ) | 2014 ජූලි 11 දිනැති අතිවිශේෂ ගැසට් අංක 1870/71 මගින් ජාතික කාබනික පාලන ඒකකයක් මණ්ඩලයේ ස්ථාපිත කර තිබූ අතර වසර 3ක් ගත වීමෙන් පසු එනම් 2017 අගෝස්තු 31 දිනැති අංක 2017/8/74 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අනුව රු.750,000ක් ගෙවීමේ පදනම යටතේ ඒ සඳහා උපදේශකවරයෙකු බඳවා ගෙන තිබූ අතර අදාල ගිවිසුමේ ප්‍රකාරව රු.750,000ක් ගෙවා තිබුණි. තව ද ජාතික කාබනික ඒකකය ස්වාධීන ඒකකයක් ලෙස පවත්වා ගතයුතු බව ගැසට් නිවේදනයේ සඳහන් කර තිබුණ ද මෙය කෘෂි ඒකකය යටතේ පවත්වාගෙන ගොස් තිබුණි. තව ද උපදේශනාත්මක කමිටු හා තාක්ෂණික කමිටුව කාර්තුවකට වරක් රැස්විය යුතු වුව ද සමාලෝචිත වර්ෂයේ දී එක් | කාබනික කෘෂිකර්මාන්තය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් නිකුත් කරන ශ්‍රී ලංකා ප්‍රමිති අංක 1324 ප්‍රතිශෝධනය කර ප්‍රකාශයට පත්කිරීම 2019 පෙබරවාරි මස දක්වා සිදු නොකිරීම නිසා තාක්ෂණික කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි විය. 2019 මාර්තු මස මෙම රැස්වීම පවත්වා ලියාපදිංචිය නිකුත් කිරීමට කටයුතු කර ඇත. තාක්ෂණික කමිටුවේ සියලු තීරණ ගනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති අංක 1324 ට අනුවය. | ජාතික කාබනික පාලන ඒකකය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූ ලියාපදිංචි වීම් සහතික කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපදේශනාත්මක රැස්වීමක් පමණක් පවත්වා තිබුණද තාක්ෂණික කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. තවද 2017 වර්ෂයේ රු.155,149ක් ද 2018 වර්ෂයේ දී රු.136,149ක් මේ වෙනුවෙන් වැය කර තිබූ අතර අයදුම් පත්‍ර 100ක් ලැබී තිබුණද කිසිම ආයතනයකට ලියාපදිංචි වීම් සහතික නිකුත් කර නොතිබුණි. | | |
| (ඇ) | මැද පෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපවල ආහාරපාන සඳහා ඇති වෙළඳපළ කොටස් වර්ධනය කර ගැනීමේ අරමුණින් 2018 පෙබරවාරි 18 සිට 22 දක්වා පැවැති Gulf Food වෙළඳ ප්‍රදර්ශනයට රු.මිලියන 11.67 ක් වැයකර සමාගම් 24 ක් සහභාගී කරවා තිබූ අතර ඉන් සමාගම් 09 ක අපනයන ප්‍රමාණය සියයට 1 සිට සියයට 51 දක්වා පිරිහී තිබුණි. | 2018 වසරේ ශ්‍රී ලංකාවේ පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන් පොල් හා තේ ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික අමුද්‍රව්‍ය වල මිල ඉහලයාම නිසා ජාත්‍යන්තර වෙළඳපළෙහි තරඟකාරීත්වය අඩු විය. තේ අපනයනය කරනු ලබන සමාගම්වල අපනයනයන් පිරිහීමට තේ සඳහා වූ ජාත්‍යන්තර වෙළඳපළෙහි මතුව ඇති අර්බුදකාරී ගැටළු සෘජුවම බලපා ඇත. තේ සඳහා ඉරානය, සිරියාව, ලිබියාව, තුර්කි වැනි රටවල ආර්ථික අර්බුද හා තේ අපනයන කරන අනිත් රටවල දැඩි තරඟකාරීත්වය ඊට හේතු වීම. | වෙළඳ ප්‍රදර්ශනවලට අපනයනකරුවන් සහභාගී කර වීමේ දී අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය ඔවුන්ට මූල්‍ය මෙන්ම උපදේශාත්මක මඟ පෙන්වීමක් ලබා දිය යුතුය. |
| (ඈ) | මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධ වෙළඳ ගනුදෙනු වැඩි කිරීමේ අරමුණින් 2018 අප්‍රේල් 24 දින සිට අප්‍රේල් 26 දින දක්වා බෙල්ජියමේ බ්‍රසිල් හි පැවැති (සී ෆුඩ් එක්ස්පෝ ගෝල්ඩ්) වෙළඳ ප්‍රදර්ශනයට අපනයනකරුවන් 09 | පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ මාළු සැපයුම ඉතා අඩු විය. අපනයන සමාගම් වෙත මාළු ලැබෙන ප්‍රමාණය අනුව ඔවුන් ගැණුම් කරුවන්ගෙන් ඇණවුම් ලබා ගනී. | ප්‍රමාණවත් සැපයුමක් නොමැති වීම අපනයන අඩු වීමට හේතුව බැවින් අපනයන ක්ෂේත්‍රය වෙත නවක මත්ස්‍ය නිෂ්පාදනයන් යොමු කරවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| දෙනෙකු සහභාගී කරවා තිබූ අතර ඉන් සමාගම් 5ක් සඳහා සිව් වතාවකට වැඩි වාර ගණනක් අනුග්‍රහය ලබා දී තිබුණි. තව ද එක්වරක් පමණක් සහභාගී වූ අපනයනකරුවන්ට ප්‍රදර්ශන බිම් කුලිය හා ප්‍රදර්ශන කුටි පිරිවැය සඳහා සියයට 100 ක අනුග්‍රහයක් සැපයිය යුතු වුවත් එවැනි සමාගම් 2 ක් සඳහා සියයට 50 ක අනුග්‍රහයක් ලබා දී තිබුණි. එසේ ම ප්‍රදර්ශනයට සහභාගී වූ සමාගම් 5 ක අපනයන ප්‍රමාණය ඉකුත් වර්ෂය සහ සැසඳීමේ දී සියයට 5 සිට සියයට 52 දක්වා පරාසයක අඩු වී තිබුණි. | | |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති නමුත් 2018 වර්ෂය තුළ දී ක්‍රියාත්මක නොකරන ලද වැඩසටහන් 16 ක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු.මිලියන 15.25 ක් විය. | මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට ප්‍රසම්පාදන කමිටු තීරණ ප්‍රමාදය, සුදුසු උපදේශකයෙකු හඳුනා ගැනීමට නොහැකිවීම සහ පිරිවැය ගැටළු හේතු විය. | මෙහි දී බලපෑ ගැටළු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ක්‍රියාත්මක කල හැකි මට්ටමේ සැලසුම් සැකසිය යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 272 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 224 ක් වූයෙන් තනතුරු 48 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්ද කනිෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්ද පහළ මට්ටමේ තනතුරු 11 ක්ද පුරප්පාඩුව පැවතිණි. | 2018 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 272 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 224 ක් වූයෙන් තනතුරු 48 ක් පුරප්පාඩුව පැවතිණ. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 අතරින් අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා අනුමත වූ නව තනතුරු පිරවීමට ප්‍රථම එම තනතුරුවලට අදාල බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අනිකුත් තනතුරු වන සහකාර අධ්‍යක්ෂ (මුදල්), අපනයන ප්‍රවර්ධන නිලධාරි, පරිගණක වැඩ සටහන් සම්පාදක තනතුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව 2019 මැයි 09 වන දින පිරවීම සඳහා කටයුතු කර ඇත. | අදාල තනතුරු හඳුනා ගෙන එම පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |